## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1982 අංක 36 දරන සාප්පු සහ කාර්යාලයීය සේවක (සේවා නියුක්තිය සහ පාරිශ්‍රමික විධිමත් කිරීම) සහ පඩි පාලක සභා (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1982 ඔක්තෝබර් මස 12 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1982 ඔක්තෝබර් මස 15 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

මිළ : ශත 15 යි        තැපැල් ගාස්තුව : ශත 50 යි

1982 අංක 36 දරන සාප්පු සහ කාර්යාලයීය සේවක (සේවා නියුක්තිය සහ පාරිශ්‍රමික විධිමත් කිරීම) සහ පඩි පාලක සභා (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1982 ඔක්තෝබර් මස 12 වන දින]

එල්. ඩී.—ඕ. 64/81

**සාප්පු සහ කාර්යාලයීය සේවක (සේවා නියුක්තිය සහ පාරිශ්‍රමික විධිමත් කිරීම) පනත සහ පඩි පාලක සභා ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

**1.** මේ පනත 1982 අංක 36 දරන සාප්පු සහ කාර්යාලයීය සේවක (සේවා නියුක්තිය සහ පාරිශ්‍රමික විධිමත් කිරීම) සහ පඩි පාලක සභා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**I වන කොටස**

129 වන අධිකාරයේ 52 වන වගන්තිය සංශෝධනය කිරීම.

**2.** සාප්පු සහ කාර්යාලයීය සේවක (සේවා නියුක්තිය සහ පාරිශ්‍රමික විධිමත් කිරීම) පනතේ 52 වන වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උප වගන්ති ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(2) (1) වන උපවගන්තිය යටතේ සේවා යෝජකයකු වරද කරු කරනු ලැබූ විටක, අධිකරණය විසින් පනවනු ලැබිය හැකි වෙනත් යම් දණ්ඩනයකට අතිරේකව—

(අ) සේවානියුක්තයකුට නිසි ලෙස ගෙවිය යුතුව තුබූ මුදල ඒ සේවානියුක්තයාට නොගෙවන ලද අවස්ථාවක, අධිකරණය විසින් දැනගනු ලබන ඒ මුදල හා ඇත්ත වශයෙන් ගෙවන ලද මුදල අතර ඇති වෙනසට සමාන මුදල සහ (2අ) උපවගන්තියේ සඳහන් අධිභාරය; හෝ

(ආ) ඒ සේවානියුක්තයාට ලැබිය යුතු පාරිශ්‍රමිකයෙන් කිසිම පංගුවක් නොගෙවන ලද අවස්ථාවක, අධිකරණය විසින් දැනගනු ලබන ඒ මුදලට සමාන පාරිශ්‍රමිකය සහ (2අ) උපවගන්තියේ සඳහන් අධිභාරය

ගෙවීමට සේවායෝජකයාට අධිකරණය විසින් ආඥා කරනු ලැබිය හැකි ය. මේ උපවගන්තිය යටතේ ගෙවීමට ආඥා කරන ලද යම් මුදලක් දඩයක් අයකර ගනු ලබන ආකාරයෙන් ම අය කර ගනු ලැබිය හැකි ය.

(2අ) (2) වන උපවගන්තියේ (අ) ඡේදයෙහි හෝ (ආ) ඡේද යෙහි හෝ සඳහන් යම් මුදලක් මත ගෙවිය යුතු අධිභාරය පහත දැක්වෙන පරිදි ගණන් බැලිය යුතු ය:—

(අ) ඒ මුදල මාස එකක් ඉක්මවන එහෙත් මාස තුනක් නො ඉක්මවන කාලයකට හිඟව ඇති අවස්ථාවක, ඒ මුදලෙන් සියයට විස්සක අධිභාරයක්;

(ආ) ඒ මුදල මාස තුනක් ඉක්මවන එහෙත් මාස හයක් නො ඉක්මවන කාලයකට හිඟව ඇති අවස්ථාවක, ඒ මුදලෙන් සියයට තිහක අධිභාරයක්;

2—ජ 64343 — 14,900 (82/07)

(ඇ) ඒ මුදල මාස හයක් ඉක්මවන එහෙත් මාස දොළහක් නො ඉක්මවන කාලයකට හිඟව ඇති අවස්ථාවක, ඒ මුදලෙන් සියයට හතළිහක අධිභාරයක් ;

(ඈ) ඒ මුදල මාස දොළහක් ඉක්මවන කාලයකට හිඟව ඇති අවස්ථාවක, ඒ මුදලෙන් සියයට පනහක අධිභාරයක්.".

## II වන කොටස

136 වන අධිකාරයේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. (මේ කොටසෙහි "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් හඳුන්වනු ලබන) පඩි පාලක සභා ආඥාපනතේ 4 වන වගන්තියෙහි (2) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්ති ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(2) (1) වන උපවගන්තිය යටතේ යම් කම්කරුවකු සම්බන්ධයෙන් සේවායෝජකයකු වරදකට වරදකරු කරනු ලැබූ විටක, අධිකරණය විසින් පනවනු ලැබිය හැකි වෙනත් යම් දණ්ඩනයකට අතිරේකව—

(අ) කම්කරුවකුට නිසි ලෙස ගෙවිය යුතුව තිබූ මුදල ඒ කම්කරුවාට නොගෙවන ලද අවස්ථාවක, අධිකරණය විසින් දැන ගනු ලබන ඒ මුදල හා ඇත්ත වශයෙන් ගෙවන ලද මුදල අතර ඇති වෙනසට සමාන මුදල සහ (2අ) උපවගන්තියේ සඳහන් අධිභාරය ; හෝ

(ආ) ඒ කම්කරුවාට ලැබිය යුතු වේතනයෙන් කිසිම පංගුවක් ඒ කම්කරුවාට නොගෙවන ලද අවස්ථාවක, අධිකරණය විසින් දැනගනු ලබන ඒ වේතනවලට සමාන මුදල සහ (2අ) උපවගන්තියෙහි සඳහන් අධිභාරය

ගෙවීමට සේවායෝජකයාට අධිකරණය විසින් ආඥා කරනු ලැබිය හැකිය. මේ උපවගන්තිය යටතේ ගෙවීමට ආඥා කරන ලද යම් මුදලක් දඩයක් අයකර ගනු ලබන ආකාරයෙන් ම අයකර ගනු ලැබිය හැකි ය.

(2අ) (2) වන උපවගන්තියේ (අ) ඡේදයෙහි හෝ (ආ) ඡේදයෙහි සඳහන් යම් මුදලක් මත ගෙවිය යුතු අධිභාරය පහත දැක්වෙන පරිදි ගණන් බැලිය යුතු ය:—

(අ) ඒ මුදල මාස එකක් ඉක්මවන එහෙත් මාස තුනක් නො ඉක්මවන කාලයකට හිඟව ඇති අවස්ථාවක, ඒ මුදලෙන් සියයට විස්සක අධිභාරයක් ;

(ආ) ඒ මුදල මාස තුනක් ඉක්මවන එහෙත් මාස හයක් නො ඉක්මවන කාලයකට හිඟව ඇති අවස්ථාවක, ඒ මුදලෙන් සියයට තිහක අධිභාරයක් ;

(ඇ) ඒ මුදල මාස හයක් ඉක්මවන එහෙත් මාස දෙළහක් නො ඉක්මවන කාලයකට හිඟව ඇති අවස්ථාවක, ඒ මුදලෙන් සියයට හතළිහක අධිභාරයක් ;

(ඈ) ඒ මුදල මාස දෙළහක් ඉක්මවන කාලයකට හිඟව ඇති අවස්ථාවක, ඒ මුදලෙන් සියයට පනහක අධිභාරයක්.".

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 44 වන වගන්තියෙහි (3) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 44 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(3) (1) වන උපවගන්තිය හෝ (2) වන උපවගන්තිය යටතේ සේවායෝජකයකු වරදකරු කරනු ලැබූ විටක අධිකරණය විසින් පනවනු ලැබිය හැකි වෙනත් යම් දණ්ඩනයකට අතිරේකව—

(අ) කම්කරුවකුට නිසි ලෙස ගෙවිය යුතුව තුබූ මුදල ඒ කම්කරුවාට නොගෙවන ලද අවස්ථාවක, අධිකරණය විසින් දැන ගනු ලබන ඒ මුදල හා ඇත්ත වශයෙන් ගෙවන ලද මුදල අතර ඇති වෙනසට සමාන මුදල සහ 4 වන වගන්තියේ (2අ) උපවගන්තියෙහි දක්වා ඇති ආකාරයට ගණන් බලනු ලැබූ අධිභාරය ; හෝ

(ආ) ඒ කම්කරුවාට ලැබිය යුතු වේතනයෙන් කිසිම පංගුවක් නොගෙවන ලද අවස්ථාවක, අධිකරණය විසින් දැන ගනු ලබන ඒ වේතනවලට සමාන මුදල සහ 4 වන වගන්තියේ (2අ) උපවගන්තියෙහි දක්වා ඇති ආකාරයට ගණන් බලනු ලැබූ අධිභාරය

ගෙවීමට සේවායෝජකයාට අධිකරණය විසින් ආඥා කරනු ලැබිය හැකි ය.".